The Journal of Archaeology and Heritage Studies (JAHS) 8 (I) 2021: 46 - 53

The Journal of

Archaeology & Heritage Studies

Journal Home page

Research Paper

# Enhancing Child Education through Positively Organizing Museums

**Piyumi Ambuldeniya**[1] **Buddhisha Weerasuriya**[2]

[1] **Piyumi Embuldeniya,** Department of Archaeology, Faculty of Arts, University of Peradeniya, Sri Lanka piyumie@arts.pdn.ac.lk

[2] **Buddisha Weerasuriya,** Department of Archaeology, Faculty of Arts, University of Peradeniya, Sri Lanka buddisha@pgihs.ac.lk

ARTICLE INFO

***Article History:***
Received 31 December 2022
Accepted 31 May 2023
Available online 01 October 2023

ABSTRACT

Museums are not just exhibiting artifacts. According to the new museological concepts, it has different meanings, objectives, and functions. This study has developed a concept that helps to improve child education through museums as its main objective. Further, this study emphasized the importance of implementing the educational modules and methods that are currently being used in the museums located around the world for the education of Sri Lanka through the museums. This research is based on the collected data through the mixed-methods approach and firsthand experiences gained through participatory observations. This study focused on theories connected with museology, child education, and child psychology. These theories supported the development of an effective new model that benefits ethnic harmony, empathy, thinking based on equality, nationality, and a better future through personality development, critical thinking, education, and enjoyment with the inputs of experiences, sensuality, knowledge, and information that could provide through museums.

**Key words:** *Children, Child psycology, Education, Museum*

## ළමා අධ්‍යාපනය කෙරෙහි ධනාත්මක ලෙස කෞතුකාගාර සංවිධානය කිරීමේ වැදගත්කම

### 1.හැඳින්වීම

වර්තමානයේ දී කෞතුකාගාර කාර්‍යයමය වශයෙන් සහ සංකල්පමය වශයෙන් විවිධ දිශානතීන් වෙත යොමු වී තිබේ. කෞතුකාගාර හුදෙක් පුරාවස්තු ප්‍රදර්ශනය කරන හෝ පුරාවස්තු ගබඩා කර තිබෙන ගොඩනැගිල්ලක් නොවන අතර කෞතුකාගාර ඔස්සේ අධ්‍යාපනය ලබා දීම ප්‍රමුඛ වේ. මෙම පර්යේෂණ ලිපිය මගින් අවධානය යොමුකෙරෙන්නේ කෞතුකාගාර නව අධ්‍යාපනික ආකෘතියක් ලෙස ළමයාට සමීප කරවීමේ ක්‍රමවේද පිළිබඳවයි. නූතන ලෝකයේ ජනප්‍රිය ලෙස ක්‍රියාත්මකවන කෞතුකාගාර සම්බන්ධ අධ්‍යාපනික ආකෘති සහ ක්‍රමවේද වඩා උචිත පරිදි ශ්‍රී ලංකාවේ භාවිත කිරීමේ අවශ්‍යතාවය මෙමගින් තවදුරටත් සාකච්ඡා කෙරෙයි.

**කෞතුකාගාරයක් යනු**

ජාත්‍යන්තර කෞතුකාගාර සංගමය (International Council of Museums - ICOM) මගින් "කෞතුකාගාරය" පිළිබඳ නිර්වචන ඉදිරිපත්කර ඇත. ඒ අනුව වර්ෂ 2022 දී ජාත්‍යන්තර කෞතුකාගාර සංගමය මගින් "කෞතුකාගාරය" යන්න සඳහා ඉදිරිපත්කර තිබූ නිර්වචනය යාවත්කාලීන කර ඇත. ඒ අනුව කෞතුකාගාරයක් යනු, ස්පර්ශිත සහ අස්පර්ශිත උරුමයන් පිළිබඳ පර්යේෂණ, එක්රැස් කිරීම, සංරක්ෂණය, අර්ථකථනය, සහ ප්‍රදර්ශනය සිදුකරනු ලබන සමාජ සේවයට කැපවූ ලාභ නොලබන ස්ථිර ආයතනයකි. මහජනතාවට විවෘතවූ කෞතුකාගාර මගින් විවිධත්වය සහ තිරසාරත්වය පෝෂණය කරයි. කෞතුකාගාර ආචාරධර්මානුකූලව, වෘත්තීයමය වශයෙන් මෙන්ම ප්‍රජා සහභාගිත්වයක් සහිතව ක්‍රියාත්මක වන අතර අධ්‍යාපනය, රසවින්දනය, ආවර්ජනය, සහ දැනුම බෙදාගැනීම සඳහාවූ විවිධ අත්දැකීම් සන්නිවේදනය කරනු ලබයි"

> A museum is a not-for-profit, permanent institution in the service of society that researches, collects, conserves, interprets and exhibits tangible and intangible heritage. Open to the public, accessible and inclusive, museums foster diversity and sustainability. They operate and communicate ethically, professionally and with the participation of communities, offering varied experiences for education, enjoyment, reflection and knowledge sharing."



JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. +94 25 2266618

(In, on, the Extraordinary General Assembly of ICOM, Prague, 24th August 2022)

මෙම නිර්වචනයට අනුව කෞතුකාගාර සතු ප්‍රධාන කාර්යයභාරයන් ලෙස ස්පර්ශිත සහ අස්පර්ශිත උරුමයන් එක්රැස්කිරීම, ලේඛනගත කිරීම, සංරක්ෂණය කිරීම, පර්යේෂණ කිරීම, ප්‍රදර්ශනය කිරීම, අධ්‍යාපනය ලබාදීම, සහ ආරක්ෂා කිරීම ආදිය හඳුනාගත හැකිය. මේ අතුරින් අධ්‍යාපනය ලබාදීම ඉතා වැදගත් කෞතුකාගාර කාර්යයභාරයක් වශයෙන් සැලකිය හැකිය. කෞතුකාගාර යනු අධ්‍යයනයට-අධ්‍යාපනයට පවත්වගෙනයනු ලබන ස්ථිර ආයතනයක් බව නිර්වචනය තුළ සඳහන් වීම හරහා ම කෞතුකාගාර මගින් අධ්‍යාපනය ලබාදීම ඉතා වැදගත්වන බව පැහැදිලි වේ.

**අධ්‍යාපනය හා කෞතුකාගාරය**

අධ්‍යාපනය යනු මිනිසුන්ගේ හදවත සහ මනස සමග සම්බන්ධවූවකි. එසේම අධ්‍යාපනය යනු සදාචාරාත්මක, භෞතික, බුද්ධිමය, විද්‍යාත්මක වටිනාකම් සහ දැනුම සංවර්ධනය කරගැනීමේ ක්‍රියාවලියයි (Key Concepts of Museology, 2010: 31) එසේම Key Concepts of Museology නම් ග්‍රන්ථයෙහි තවදුරටත් අධ්‍යාපනය යන්න පැහැදිලිකර ඇති ආකාරය පහත පරිදි උපුටා දැක්විය හැකිය.

> "කෞතුකාගාර සංකල්පය තුළ අධ්‍යාපනය යනු කෞතුකාගාර ඇසුරෙන් පැනනැඟුණු දැනුම සංවිධානාත්මකව ඉදිරිපත්කිරීම, සහ නව අත්දැකීම් සම්බන්ධයෙන් නව සංවේදීතාවයන් සහ වටහාගැනීම් සංවර්ධනය කරගැනීම ඔස්සේ පුද්ගලයින්ගේ සංවර්ධනය සහ පරිපූර්ණත්වය ගොඩනැංවීමට කෞතුකාගාර ඇසුරෙන් ලැබෙන දැනුම උකහාගැනීම බව හඳුනාගත හැකිය (ibib:31)".

Key Concepts of Museology (2010), ග්‍රන්ථයේ තවදුරටත් සඳහන්වනුයේ අධ්‍යාපනය යනුවෙන් අර්ථවත් කෙරෙන්නේ, මිනිසා පුහුණු කිරීම සහ සංවර්ධනය කිරීම මෙන් ම ඔවුන්ගේ හැකියාවන් වඩාත් පුහුණු කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා උචිත ක්‍රමවේද හඳුන්වාදීමය. එසේම, කෞතුකාගාර අධ්‍යාපනය විවිධ අගයන්, සංකල්ප, දැනුම සහ පරිචයන්ගේ එකතුවකින් සමන්විතවන අතර එය කෞතුකාගාර නරඹන්නන් සංවර්ධනය කිරීම සහතික කරනු ලබයි. අධ්‍යාපනය අනිවාර්යයෙන් ම හදවත සහ මොළය සමග බද්ධ වී ඇත. එසේම, අධ්‍යාපනය මගින් ආචාරධාර්මික සංවර්ධනය මෙන් ම ඉන්ද්‍රියගෝචර, බුද්ධිමය, සහ විද්‍යාත්මක අගයන් ද පෝෂණය කරයි. එහෙයින් කෞතුකාගාර අධ්‍යාපනික ක්‍රමවේද සහ ආකෘති නිර්මාණය කිරීමේ දී දැනුම සහ ආකල්ප සංවර්ධනය කෙරෙහි උචිත ලෙස සකස් විය යුතු ය.

විශේෂයෙන් කෞතුකාගාරයක් මගින් අධ්‍යාපනය ලබාදීම සඳහා දෙයාකාරයකින් දායකත්වය ලබාදීම සිදුවේ.

01. විධිමත් අධ්‍යාපනය (Formal Education)

02. අවිධිමත් අධ්‍යාපනය (Informal Education/ Informal Learning)

කෞතුකාගාර මගින් මෙවැනි අධ්‍යාපනික කාර්යයක් ඉටුකිරීමේදී කෞතුකාගාර ඉතා ඵලදායී ලෙස කළමනාකරණය කිරීම වැදගත්වේ (Ambrose & Paine, 2006: 9-10);

කෞතුකාගාර පිළිබඳ පූර්ණ ක්‍රියාවලිය එනම්, එක්රැස්කිරීම, ප්‍රලේඛනය, සංරක්ෂණය, හා පර්යේෂණ අවසන්වන්නේ නව දැනුමක් ලබාගැනීමෙනි. මෙම නව දැනුම විරාගත මාධ්‍යය වූ ශාස්ත්‍රීය ප්‍රකාශන මගින් විද්වතුන් හා විද්‍යාඥයින් අතර වරින්වර බෙදාහැරීමට ක්‍රියාකරනු ලබයි. අධ්‍යාපනික දැනීම හුවමාරුකරගැනීම සඳහා බලවත් ආධාරකයක් වශයෙන් කෞතුකාගාර මාධ්‍යය යොදාගැනීම විසිවන සියවසෙහි ඇති වූ විශේෂ සිදුවීමකි. වර්තමානය වනවිට වෙනත් කිසිදු කාලයකට වඩා අධ්‍යාපන සහ කෞතුකාගාර විශේෂඥවරු අතර කෞතුකාගාරවල අධ්‍යාපන වැදගත්කම පිළිබඳ මනා අවබෝධයක් පවතියි. එහෙයින් කෞතුකාගාරය සමාජය, සංස්කෘතිය, විද්‍යාව, සහ කාර්මිකවිද්‍යාව පිළිබඳ ජාතියේ උරුමය ආරක්ෂාකරන මධ්‍යස්ථාන පමණක් නොව සමස්ත සමාජයට අධ්‍යාපනය සලසන මධ්‍යස්ථාන වේ (ද සිල්වා, 1996:94).

ඇමරිකානු කෞතුකාගාර සංගමය (American Association of Museums) හෙවත් වර්තමානයේ දී ඇමරිකානු කෞතුකාගාර සන්ධානය (American Alliance of Museums) නමින් හඳුන්වන ආයතනය මගින් ඉදිරිපත්කර ඇති කෞතුකාගාර ආචාරධර්ම අතර කෞතුකාගාර හරහා දැනුම ප්‍රවර්ධනය කළ යුතු බව දැක්වේ. එම නිර්වචනයේ අර්ථය අනුව කෞතුකාගාර එහි ප්‍රදර්ශනය කරනු ලබන ලෝකයේ ස්වභාවික සහ සංස්කෘතික උරුමයන් කෙරෙහි අවධානය යොමුකර ස්වභාවික සාධක පිළිබඳව සහ මානව අත්දැකීම් පිළිබඳව වටහාගත යුතු බවත් ඒ හරහා දැනුම සම්ප්‍රේෂණය කළ යුතු බවත් දක්වා ඇත.

කෞතුකාගාර සංකල්පය තුළ අධ්‍යාපනය යනු කෞතුකාගාර ඇසුරෙන් පැනනැඟුණු දැනුම සංවිධානාත්මකව ඉදිරිපත් කිරීම, සහ නව අත්දැකීම් සම්බන්ධයෙන් නව සංවේදීතාවයන් සහ වටහාගැනීම් සංවර්ධනය කරගැනීම හරහා පුද්ගලයින්ගේ සංවර්ධනය සහ පරිපූර්ණත්වය ගොඩනැංවීමට කෞතුකාගාර ඇසුරෙන් ලැබෙන දැනුම උකහාගැනීමය (Key Concepts of Museology, 2010:31) දැනුම ප්‍රවර්ධනය සහ මානව ජීවිතය පෝෂණය කිරීම සඳහා කෞතුකාගාර සතු ඉතා වැදගත් සම්පත් භාවිත කිරීමට සෑම කෞතුකාගාරයක්ම කැප වී සිටියි. එසේ ම කෞතුකාගාර හරහා අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමට සෑම කෞතුකාගාරයකම කෞතුකාගාර භාරකරුවන්, කාර්යය මණ්ඩලය, සහ ස්වේච්ඡා කාර්යය මණ්ඩලය එක්ව කටයුතු කළ යුතු වේ (Excellence in Practice: Museum Education Principles and Standards, 2005: 6).

සියලුම කෞතුකාගාරවල භාරකරුවන්, කාර්යය මණ්ඩලය, සහ ස්වේච්ඡා කාර්යය මණ්ඩලය විසින් නිරවද්‍යතාවයෙන් යුක්තව, පැහැදිලි ලෙස සහ අදාළත්වයෙන් යුක්තව කෞතුකාගාරය සතු අධ්‍යාපනික සම්පත් ජනතාව අතරට රැගෙනයාමට හැකිවන පරිදි

කෞතුකාගාර මෙහෙවර ප්‍රකාශය සකස්කළ යුතු ය. විවිධ අදහස් සහ ප්‍රකාශන සපයාගැනීම, නරඹන්නන් වෙත කෞතුකාගාරය මගින් ලබාදෙන අධ්‍යාපනය සම්බන්ධයෙන් සහ ඒ කෙරෙහි කෞතුකාගාරයේ බලපෑම සම්බන්ධයෙන් තොරතුරු රැස්කිරීම, දැනුම වර්ධනය කරගැනීමට සහ ස්වයං අධ්‍යයනවල යෙදීම සඳහා අවශ්‍ය තාක්ෂණික ඥානය සහතික කිරීම, සහ කෞතුකාගාර පරිසරය තුළ ආයතනික ප්‍රතිපත්ති, වැඩසටහන් සහ නිර්මාණ සම්බන්ධයෙන් ගෞරවාන්විත බව සහතික කිරීම යන සාධක කෙරෙහි ද සියලුම කෞතුකාගාරවල භාරකරුවන්, කාර්යය මණ්ඩලය, සහ ස්වේච්ඡා කාර්යය මණ්ඩලය විසින් අවධානය යොමුකළ යුතු වේ (ibib: 6).

ජී. ආර්. දිසානායක විසින් ශ්‍රී ලංකාවේ කෞතුකාගාර හා සන්නිවේදනය නම් කෘතියෙහි සඳහන්කර ඇත්තේ " කෞතුකාගාර ආරම්භක සමයේ දී ඒවා භාණ්ඩ එක්රැස්කරන තැනක්වුව ද 1960 ගණන්වලින් පසුව ඒවායේ පරමාර්ථ වෙනස් විය. එනම් අධ්‍යාපන මධ්‍යස්ථාන ලෙස භාවිත කිරීමට පටන්ගත්තේ පසුකාලයේදීය. විශේෂයෙන් 1996 වර්ෂයේදී කෝපන්හේගන්හි පැවැත්වූ ජාත්‍යන්තර කෞතුකාගාර සම්මේලනයේදී කෞතුකාගාර අධ්‍යාපනයේ වැදගත්කම ගැන අවධානය යොමුකරන ලදී." යනුවෙනි. එසේ ම මෙහි සඳහන්වනුයේ යුනෙස්කෝ සංවිධානය මගින් කෞතුකාගාර නරඹන්නන්; යම් විෂයයක් සම්බන්ධව ප්‍රායෝගික දැනුමක් ඇති වැඩිහිටි අය; වැඩිහිටි සාමාන්‍ය නරඹන්නන්, සහ ළමා නරඹන්නන් වශයෙන් කොටස් තුනකට බෙදා දක්වන බවයි (දිසානායක, 1999: 80).

ඉගෙනීම යනු කරුණු පමණක් නොවන අතර එයට අත්දැකීම් සහ හැඟීම් ද ඇතුළත් වන බැවින් කෞතුකාගාර හරහා නරඹන්නන් රැසකට අධ්‍යාපනය ලබාදීමට හැකියාව ලැබේ. යමක් ඉගෙනීම සමාජ අත්දැකීමක් ලෙස මතක තබා ගැනීම ද වැදගත්වන අතර ඒ කෙරෙහි කෞතුකාගාර ඍජු ලෙසම දායක වේ. කෞතුකාගාර මගින් නරඹන්නන්හට තමන්ට අවශ්‍ය ලෙස කෞතුක භාණ්ඩ අත්විඳිමින් අධ්‍යාපනය ලබාගැනීමට අවකාශය සැලසෙන බැවින් කෞතුකාගාර මගින් ලැබෙන අධ්‍යාපනය "Free-choice learning" ලෙස ද හඳුන්වනු ලබයි (Ambrose & Paine, 2006: 46).

ඉහත න්‍යායාත්මක කරුණු ආශ්‍රයෙන් සනාථ වන්නේ කෞතුකාගාර සහ අධ්‍යාපනය යනු එකිනෙක බද්ධ වූ සංකල්ප ද්වයක් බවයි.

**කෞතුකාගාරය අධ්‍යාපනික මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියාත්මකවන ආකාරය**

කෞතුකාගාර අධ්‍යාපනික මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියාත්මකවීමේදී විවිධ ඉගෙනුම් න්‍යායයන් සහ අධ්‍යාපන ක්‍රමවේද භාවිත කරනු ලබයි. කෞතුකාගාර මගින් පවත්වනු ලබන අධ්‍යාපන වැඩසටහන් පහත පරිදි දැක්විය හැකිය.

- දේශන, වැඩමුළු, සම්මන්ත්‍රණ, ව්‍යාපෘති
- මාර්ගෝපදේශන සේවා
- මහජන වැඩසටහන්
- ප්‍රදර්ශන
- ප්‍රකාශන කෞතුකාගාර මගින් විවිධ විෂයයන් හෝ විශේෂිත පර්යේෂණ පිළිබඳව ප්‍රකාශයට පත්කරනු ලබන ග්‍රන්ථ, අත්පත්‍රිකා
- ශ්‍රව්‍ය දෘශ්‍ය වැඩසටහන්
- අධ්‍යාපනික ගුවන්විදුලි සහ රූපවාහිනි වැඩසටහන්
- වැඩිහිටි සාක්ෂරතා වැඩපිළිවෙළවල්
- විශ්වවිද්‍යාල සිසුන් සඳහා වැඩමුළු
- තැපැල් මාර්ගික පාඨමාලා
- බහුසංස්කෘතික කටයුතු සහ අධ්‍යාපනික කව සංවිධානය කිරීම

කෞතුකාගාර මගින් පවත්වනු ලබන අධ්‍යාපන වැඩසටහන් විවිධ වයස් කාණ්ඩවල පිරිස සඳහා ත් විවිධ අධ්‍යාපන මට්ටම්වල පිරිස සඳහා ත් විවිධ බුද්ධි මට්ටම්වල පිරිස සඳහා ත් විශේෂ අවශ්‍යතා ඇති පිරිස සඳහා ත් (මානසික සහ ශාරීරික වශයෙන් විශේෂ අවශ්‍යතා සහිත පිරිස) ආදී වශයෙන් එක් එක් කණ්ඩායම්වලට උචිත පරිදි නිර්මාණයකර ඇත. ඒ අනුව කෞතුකාගාර මගින් අධ්‍යාපන වැඩසටහන් සංවිධානය කිරීමේදී අදාළ අධ්‍යාපන වැඩසටහන සඳහා ඉලක්කගත පිරිස, වයස මට්ටම, රුචිකත්වය, අධ්‍යාපන මට්ටම යන සාධක කෙරෙහි විශේෂ අවධානය යොමුකරනු ලබයි. විශේෂයෙන් පාසල් සිසුන් සහ ගුරුවරුන් සඳහා මෙම අධ්‍යාපන වැඩසටහන් පවත්වනු ලබයි. එසේ ම පවුලේ සාමාජිකයින් සඳහා විශේෂිතවූ කෞතුකාගාර අධ්‍යාපන වැඩසටහන් ද කෞතුකාගාර මගින් සංවිධානය කරනු ලබයි. එමෙන් ම රාත්‍රී කාලවලදී කෞතුකාගාර තුළ රැඳීසිටිමින් විවිධ අංශ පිළිබඳ අධ්‍යාපනය ලබාදීම, ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරෙන් අධ්‍යාපනය ලබාදීම, දුරස්ථ අධ්‍යාපන වැඩසටහන් මගින් අධ්‍යාපනය ලබාදීම ආදී අධ්‍යාපන ක්‍රමවේද කෞතුකාගාර මගින් ක්‍රියාත්මක කරනු ලබයි.

**ළමා අධ්‍යාපනය කෙරෙහි කෞතුකාගාර**

යුනිසෙෆ් (UNICEF) අර්ථ දැක්වීමට අනුව, නෛතිකමය වශයෙන් ළමයා යනුවෙන් අදහස් කෙරෙන්නේ උපතේ සිට වයස අවුරුදු දහඅට දක්වා කාල පරාසයකට අයත් පිරිසයි . ළමයාගේ වර්ධනය අනුව මුල් ළමාවිය, මධ්‍යම ළමාවිය සහ නව යොවුන්විය වශයෙන් ප්‍රධාන වශයෙන් කොටස් තුනකි. මේ එක් එක් අදියේදී ළමයා සතු හැකියාවන් විවිධ වන අතර ඒ ඒ වයස් කාණ්ඩ අනුව ළමයින්ගේ පෙළඹවීම්, හැසිරීම්, උත්තේජන සහ ප්‍රතිචාර දැක්වීම් ද වෙනස් වේ. එම නිසා කෞතුකාගාර, ළමා අධ්‍යාපනය කෙරෙහි භාවිත කිරීමේදී ඉහත දැක්වූ එක් එක් වයස් කාණ්ඩ කෙරෙහි වෙන් වෙන් වශයෙන් අවධානයක් යොමු කළ යුතු වේ.

ළමා අධ්‍යාපනය වෙනුවෙන් සකස් වූ විශේෂ කෞතුකාගාර පිළිබඳ අත්දැකීම් ජාත්‍යන්තර උදාහරණ මගින් නිරීක්ෂණය කළ හැකි අතර එම වැඩසටහන් මාදිලි පිළිබඳ මෙහිදී සුවිශේෂී අවධානයක් යොමු කිරීම වැදගත් වේ. ගෝලීය උදාහරණ ලෙස නවදිල්ලි ජාතික කෞතුකාගාරය, මෙට්‍රොපොලිටන් කෞතුකාගාරය, ලන්ඩනයේ ස්වභාවිකවිද්‍යා කෞතුකාගාරය, සහ ලූවර් කෞතුකාගාරය ආශ්‍රිත ළමා අධ්‍යාපනය වෙනුවෙන්


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. +94 25 2266618

වෙන් වූ ක්‍රියාකාරකම් සහ සංකල්ප පිළිබඳව පහත පරිදි දැක්විය හැකිය.

- නවදිල්ලි ජාතික කෞතුකාගාරය ආශ්‍රිත ළමා අධ්‍යාපනික වැඩසටහන් (ඡායාරූපය 01)
  - විෂයානුබද්ධව ස්ථිර ප්‍රදර්ශනය සැළසුම් කර තිබීම සහ විවිධ තේමාවන් යටතේ තාවකාලික ප්‍රදර්ශන පැවැත්වීම
  - කෞතුකාගාර ප්‍රකාශන අංශය යටතේ විවිධ අධ්‍යාපනික ප්‍රකාශන සිදු කිරීම (පර්යේෂණ ප්‍රකාශන, මාර්ගෝපදේශන ග්‍රන්ථ, මැදිරි පත්‍රිකා, ප්‍රදර්ශන මැදිරි සම්බන්ධ අත්පත්‍රිකා, කෞතුකාගාර ප්‍රදර්ශන සුචිය, ක්‍රියාකාරකම් පොත්, ඡායාරූප සහිත තැපැල්පත්, E- Books)
  - Playtime at the NM අධ්‍යාපනික වැඩසටහන
  - A Day at the Museum අධ්‍යාපනික වැඩසටහන
  - Yuva Saathi අධ්‍යාපනික වැඩසටහන (මෙම අධ්‍යාපනික වැඩසටහන මගින් කිසිදු මුදලක් අයකිරීමෙන් තොරව කෞතුකාගාරය තුළ මාර්ගෝපදේශන කටයුතු සිදුකරනු ලබයි. මේ සඳහා ස්වේච්ඡා සේවයට කැප වූ පුහුණු මාර්ගෝපදේශකයින් යොමුව ඇත. එ මගින් අර්ථවත් සහ විනෝදයෙන් පිරුණු කෞතුකාගාර චාරිකාවක් සඳහා අවස්ථාව උදාවන අතර ම දැනුම වර්ධනය කරගැනීමට ද අවස්ථාව උදාවේ)
  - නිල වෙබ් අඩවිය ඔස්සේ ළමයින් වෙත ඉදිරිපත් කරන වැඩසටහන්
- මෙට්‍රොපොලිටන් කෞතුකාගාරය ආශ්‍රිත ළමා අධ්‍යාපනික වැඩසටහන් (ඡායාරූපය 02, ඡායාරූපය 03)
  - #MetKids වැඩසටහන
  - #MetKids & Families වැඩසටහන
  - විෂයානුබද්ධව ස්ථිර ප්‍රදර්ශනය සැළසුම් කර තිබීම සහ විවිධ තේමාවන් යටතේ තාවකාලික ප්‍රදර්ශන පැවැත්වීම.
  - වෙබ් අඩවිය ඔස්සේ ළමයින් වෙත ඉදිරිපත් කරන වැඩසටහන්
- ලන්ඩනයේ ස්වභාවිකවිද්‍යා කෞතුකාගාරය ආශ්‍රිත ළමා අධ්‍යාපනික වැඩසටහන් (ඡායාරූපය 04)
  - මාර්ගගත යෙදවුම් (Online app.)
  - කෞතුකාගාරයෙන් පිටත සිදුකරන ප්‍රායෝගික අධ්‍යාපනික ක්‍රියාකාරකම්
  - මාර්ගගත දත්ත සංචිත - Natural History Museum (2017). Dataset: Collection specimens
  - පුහුණු වැඩසටහන් කෞතුකාගාරයේ පර්යේෂණවලට සමගාමී ලෙස කෞතුකාගාරයෙන් පිටතදී ස්වභාවිකවිද්‍යා ආදර්ශක අධ්‍යයනය කිරීම සඳහා නරඹන්නන්හට අවස්ථාව සලසාදීම
  - තරග - Wildlife Photographer of the Year competition
  - විවිධ වයස් කාණ්ඩ සඳහා වෙන්වූ වැඩසටහන් සියලුම වයස් කාණ්ඩවල සිසුන් සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම් අන්තර්ගත අධ්‍යාපනික වැඩසටහන්
- ලූවර් කෞතුකාගාරය ආශ්‍රිත ළමා අධ්‍යාපනික වැඩසටහන් (ඡායාරූපය 05)
  - ළමයින් සඳහා වෙන්වූ විශේෂිත වැඩසටහන් සහිත වෙබ් අඩවිය (A Closer Look, Tales of the Museum, Through Children's Eyes)
  - මාර්ගගත ප්‍රදර්ශන (කෞතුක භාණ්ඩ පිළිබඳව නිර්මාණය කළ විශේෂිත වීඩියෝ දර්ශන සහ පැහැදිලිකිරීම් අන්තර්ගතව මාර්ගගත ප්‍රදර්ශන නිර්මාණය කර ඇත)
  - මාර්ගගත එකතුන් (Online Collections - Ancient Near Eastern Terracottas British Archaeology Brass Rubbings Collection)
  - වාර්තාමය වැඩසටහන් සහ කතාන්දර වැඩසටහන් (Masterpieces, In Search of Ideal Beauty Masterpieces, Accessible Visitor Trail)
  - සිතියම් සහ මාර්ගෝපදේශන පත්‍රිකා (ළමුන් සහ පවුලේ පිරිස සඳහා සකස් කළ විශේෂ මාර්ගෝපදේශන පත්‍රිකා)

**කෞතුකාගාර ළමා අධ්‍යාපනය සඳහා බලපෑම් කාරකයක් ලෙස**

කෞතුකාගාරයක් මගින් සිදුවන සමාජ සහ සංස්කෘතික දායකත්වයක් වශයෙන් අධ්‍යාපනික ආයතන හා සම්බන්ධ වී කටයුතු කිරීම දැක්විය හැකිය. මෙහිදී කෞතුකාගාරයක් මගින් සියලු ම වයස් කාණ්ඩවලට අයත් සිසුන් සඳහා කෞතුක භාණ්ඩ ඇසුරින් අධ්‍යාපනය ලබාගැනීමට අවශ්‍ය අවකාශය නිර්මාණය කිරීම සිදුවේ.

ඉගෙනීම කෙරෙහි දායකත්වය සපයන ආයතනයක් වශයෙන් කෞතුකාගාර මගින් සංස්කෘතික හා ස්වභාවික උරුමයන් සම්බන්ධ ද්‍රව්‍යයන් අත්විඳිමින් දැනුම වර්ධනය කරගැනීමට අවශ්‍ය අවකාශය සලසනු ලබයි. බොහෝ කෞතුකාගාර මගින් එකී කෞතුකාගාර අයත් රටට අදාළ දේශීය උරුමය පිළිබඳ තොරතුරු සමාජගත කිරීමට කටයුතු කරයි (Ambrose & Paine, 2006:9-10). දේශීය උරුමය වඩා සාධනීයව සමාජගත කිරීම වක්‍රාකාරයෙන් රටෙහි හා ගෝලීය සංවර්ධනය කෙරෙහි බලපානු ලබයි. එම කාර්යයේ සාර්ථකත්වය රඳාපවතින්නේ ළමා අවධියේදී ම ඉහත කී අත්විඳීම් ලබාදීමෙනි.

ළමා අධ්‍යාපනය කෙරෙහි බලපෑම් කාරකයක් ලෙස කෞතුකාගාර ව්‍යුහගත කිරීමේ වගකීම් පැවරෙන කණ්ඩායම් කිහිපයකි. සියලු ම කෞතුකාගාරවල භාරකරුවන්, කාර්යය මණ්ඩලය, සහ ස්වේච්ඡා කාර්යය මණ්ඩලය විසින් නිරවද්‍යතාවයෙන් යුක්තව, පැහැදිලි ලෙස සහ අදාළත්වයෙන් යුක්ත ව කෞතුකාගාරය සතු අධ්‍යාපනික සම්පත් ජනතාව අතරට රැගෙනයාමට හැකිවන පරිදි කෞතුකාගාර මෙහෙවර ප්‍රකාශය සකස්කළ යුතුය. (Excellence in Practice: Museum Education Principles and Standards, 2005: 6).

කෞතුකාගාර අධ්‍යාපනය ළමයා කෙරෙහි ඇති කරනු ලබන බලපෑම සම්බන්ධයෙන් කෞතුකාගාර විද්‍යා මූලධර්ම (1996) කෘතියේ දක්වා ඇත්තේ "ප්‍රාථමික අධ්‍යාපනය සම්බන්ධයෙන් සලකා බලන විට නිරීක්ෂණය, බුද්ධිය, විනිශ්චය කිරීම හා අනාවරණය පිළිබඳ ළමයා සතු ශක්තිය උත්තේජනය කිරීමෙහි ලා කෞතුකාගාර මාධ්‍යය, සෙසු මාධ්‍යයන් අතුරෙන් ප්‍රබල එකක් වන්නේය" යනුවෙනි.


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. +94 25 2266618

කෞතුකාගාර ළමා අධ්‍යාපනය කෙරෙහි සාධනීය බලපෑමක් සිදු කළ හැකි ආයතනයක් වශයෙන් මේ අනුව පැහැදිලි වේ. ඒ සඳහා ළමයා කෙරෙහි අධ්‍යාපනය ලබාදීම වඩා සැළකිල්ලෙන් කළ යුතු කාර්යයකි. ඒ මන්ද යත් ළමා අවධියේදී ලබාගන්නා විවිධ ආකාරයේ අත්දැකීම් ළමයා වයසින් වැඩෙත්ම පෞර්ෂ වර්ධනයට, සමාජ සුබ සිද්ධියට ආදී ප්‍රපංචයන් කෙරෙහි බලපානු ලබන බැවිනි. අධ්‍යාපනික මෙවලමක් වශයෙන් කෞතුකාගාර යොදා ගැනීමේදී කෞතුකාගාර අධ්‍යාපනික මෙවලමක් වශයෙන් ව්‍යුහගත කිරීම, ඒ තුළින් ළමයා තුළ වර්ධනය වන ලක්ෂණ, ළමයා තුළ සංවර්ධනය වන ලක්ෂණයන්හි දිගුවක් ලෙස සමාජයට, රටට සහ සමස්ත ලෝකයට ලැබෙන ප්‍රතිලාභ පිළිබඳ දාමයක් ගොඩනැගෙන බව පහත සංකල්ප රාමුව කෙරෙහි අවධානය යොමු කිරීමෙන් පැහැදිලි වේ (රූපය 01).

## 2. ක්‍රමවේදය

මෙම පර්යේෂණය ප්‍රමාණාත්මක සහ ගුණාත්මක යන දත්ත ආකාර දෙකම භාවිත කරමින් මිශ්‍ර ක්‍රමවේදයක් ඔස්සේ දත්ත සපයාගෙන තිබේ. විශේෂයෙන් ම දත්ත රැස් කිරීමේදී ශ්‍රී ලංකාව තුළ දැනට පවත්වාගෙන යනු ලබන රාජ්‍ය සහ පෞද්ගලික යන අංශ ද්විත්යේම තෝරාගත් කෞතුකාගාරවල සහභාගීත්ව නිරීක්ෂණ සිදු කිරීමත් එම කෞතුකාගාර විසින් පවත්වනු ලබන විවිධ වැඩසටහන් මෙන් ම ඔවුන්ගේ වෙබ් අඩවි සහ සමාජ මාධ්‍ය පරිහරණය කිරීමත් සිදු කරමින් අධ්‍යතන ශ්‍රී ලාංකේය කෞතුකාගාරයන්හි තේමා සහ කාර්යයන් පිළිබඳ තොරතුරු රැස් කරන ලදි. දත්ත රැස් කිරීමේදී ළමයා අරමුණු කරගෙන ජාත්‍යන්තර කෞතුකාගාර විසින් සිදු කරනු ලබන කාර්යයන් ද සහභාගීත්ව නිරීක්ෂණ මගින් සහ මාර්ගගතව අධ්‍යයනය කරන ලදි. අමතරව කෞතුකාගාර විද්‍යාව පිළිබඳ මූලධර්ම, අධ්‍යාපනවිද්‍යාව සහ ළමා මනෝවිද්‍යාව පිළිබඳ න්‍යායන් අධ්‍යයනය සිදු කරන ලද අතර දත්ත විශ්ලේෂණයේදී රැස් කළ දත්ත ජාත්‍යන්තර උදාහරණ සහ න්‍යායාත්මක ප්‍රවේෂ සමග සමගාමීව විමසමින් ශ්‍රී ලංකාවේ කෞතුකාගාර සම්බන්ධව වඩා උචිත සංකල්ප රාමුවක් නිර්මාණය කිරීම සිදු කරන ලදි.

## 3. ප්‍රතිඵල සහ සාකච්ඡාව

### ශ්‍රී ලංකාවේ කෞතුකාගාර හා ළමා අධ්‍යාපනය

ශ්‍රී ලංකාවේ කෞතුකාගාර මගින් ළමා අධ්‍යාපනය සඳහා වර්තමානයේදී ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් පිළිබඳව ත් ශ්‍රී ලංකාවේ කෞතුකාගාර මගින් ළමා අධ්‍යාපනය සඳහා ක්‍රියාත්මක කළ හැකි නව වැඩසටහන් පිළිබඳව ත් එ මගින් සමාජය වෙත සිදුකළ හැකි බලපෑම පිළිබඳව ත් මෙහිදී සාකච්ඡා කරනු ලබයි.

ශ්‍රී ලංකාවේ දැනට ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, මධ්‍යම සංස්කෘතික අරමුදල, වෙනත් රාජ්‍ය දෙපාර්තමේන්තු, ආයතන, ආගමික මධ්‍යස්ථාන, පාසල් සහ විශ්වවිද්‍යාල යටතේ කෞතුකාගාර ක්‍රියාත්මක වේ. මෙම කෞතුකාගාර ඔස්සේ විවිධ විෂයය පථයන් හා සම්බන්ධ එකතුන් ප්‍රදර්ශනය කරනු ලබයි. එසේ ම, මෙම කෞතුකාගාර ඔස්සේ පර්යේෂණ පැවැත්වීම ත් හා ප්‍රදර්ශන පැවැත්වීම ත් මහජනයාගේ අධ්‍යයනයට-අධ්‍යාපනයට අවශ්‍ය පහසුකම් සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ත් සිදුවේ.

උදාහරණ ලෙස ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන කෞතුකාගාර මගින් අධ්‍යාපනික වැඩසටහන් ලෙස කෞතුකාගාරය තුළ දේශන පැවැත්වීම, පාසල් වෙත ගොස් දේශන පැවැත්වීම, කෞතුකාගාර බස් රථය (Museum Bus) මගින් ජංගම ප්‍රදර්ශන පැවැත්වීම, තාවකාලික ප්‍රදර්ශන සංවිධානය කිරීම, කෞතුකාගාරය තුළ මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, අත්පත්‍රිකා මගින් තොරතුරු සම්ප්‍රේෂණය කිරීම ආදිය සිදුකරනු ලබයි. එසේ ම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන කෞතුකාගාර මගින් අධ්‍යාපනික වැඩසටහන් ලෙස කෞතුකාගාරය තුළ දේශන පැවැත්වීම, පාසල් වෙත ගොස් දේශන පැවැත්වීම, පාසල් මට්ටමෙන් සංගම් පිහිටුවීම, ජංගම ප්‍රදර්ශන පැවැත්වීම, තරග පැවැත්වීම ආදී කටයුතු සිදුකරනු ලබයි.

ශ්‍රී ලංකාවේ පාසල් සිසුන් කෞතුකාගාර නැරඹීම සඳහා සම්බන්ධ කරගැනීම සාමාන්‍යයෙන් වාර්ෂික අධ්‍යාපන චාරිකාවක ස්වරූපයෙන් ක්‍රියාත්මක වේ. නිදසුනක් වශයෙන් කොළඹ ජාතික කෞතුකාගාරය නැරඹීම සඳහා විවිධ ප්‍රදේශවල සිට සිසුන් රැගෙන ඒම පාසල් මට්ටමින් සිදුවේ. කෞතුකාගාරය නැරඹීමේදී කෞතුකගාරයේ එකතුව සම්බන්ධයෙන් ළමුන් දැනුවත් කිරීමේ අධ්‍යාපනික වැඩසටහනක් පවත්වනු ලබයි. මෙලෙස අධ්‍යාපනික වැදගත්කමක් සහිත වැඩසටහනක් ඔස්සේ ළමුන් දැනුවත් කිරීම ප්‍රගතිශීලී වුව ද ලෝකයේ වෙනත් කෞතුකාගාර සමග සැසඳීමේ දී ශ්‍රී ලංකාවේ කෞතුකාගාර මගින් ළමුන් වෙනුවෙන් පවත්වනු ලබන වැඩසටහන් සහ ක්‍රියාකාරකම් ප්‍රමාණවත් නොවන බව පැහැදිලිව දැකගත හැකිය. එහෙයින්, ළමා අවධියේ දී ළමයින්ගේ සිත තුළ කෞතුකාගාර නැරඹීම සම්බන්ධයෙන් අනුස්මරණීය අත්දැකීමක් සනිටුහන් කිරීම වඩාත් උචිත වේ.

### ශ්‍රී ලංකාවේ කෞතුකාගාර හා ළමා අධ්‍යාපනය සඳහා නව ප්‍රවේශයක්

ඉහත සාකච්ඡාවට ලක් කර තිබෙන ශ්‍රී ලංකාවේ කෞතුකාගාරවල ළමා අධ්‍යාපනය කෙරෙහි දැනට පවතින තත්ත්වය පිළිබඳ අවධානය යොමු කිරීමේදී පැහැදිලි වන්නේ තවමත් ශ්‍රී ලංකාවේ කෞතුකාගාර අධ්‍යාපනය සාම්ප්‍රදායික ක්‍රම මත යැපීමට සිදු වී තිබෙන බවයි. අධ්‍යාපනය හරයාත්මක ලෙස වෙනස්වන සමාජ, ආර්ථික, දේශපාලන සහ සංස්කෘතික තත්ත්වයන්ට සමගාමීව සාධනීය ආකාරයෙන් වෙනස්කම්වලට ලක්කිරීම ඵලදායීවන බැවින් ළමා අධ්‍යාපනයට උචිතවන පරිදි ද එම වෙනස්කම කෞතුකාගාරවල සිදු කිරීම වැදගත් වේ. එහිදී සැලකිළිමත් විය යුතු ප්‍රධාන තත්ත්වයන් කිහිපයකි. වයස් කාණ්ඩ පිළිබඳ අවධානය යොමු කිරීම, ඒ ඒ වයස් කාණ්ඩවලට උචිත වැඩසටහන් සම්පාදනය කිරීම සහ නව තාක්ෂණික භාවිතය ඒ අතර ප්‍රමුඛ වේ. මේ සඳහා සුදුසු ජාත්‍යන්තර උදාහරණ ඉහත සඳහන් කොට ඇති අතර එම උදාහරණ කෙරෙහි ද


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. +94 25 2266618

සැලකිල්ලිමත් වෙමින් ශ්‍රී ලංකාවට ගැලපෙන ක්‍රමවේද සකස් කරගැනීම වැදගත් වේ.

සාම්ප්‍රදායික කෞතුකාගාර ළමයින්ගේ අධ්‍යාපනික මෙවලමක් වශයෙන් ප්‍රතිව්‍යුහගත කිරීමේදී අංග රාශියක් කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කළ යුතු බව ඉහත පැහැදිලි කර තිබේ. මෙහිදී අවධානය යොමු කළ යුත්තේ වයස් කාණ්ඩ අනුව වෙන් කරමින් මූලික ක්‍රමවේද භාවිතයට උත්සාහ ගැනීමයි. කෞතුකාගාර නැරඹීම පිණිස දෛනිකව විවිධ වයස් මට්ටම්වලට අදාළ ළමයි පැමිණෙති. කෞතුකාගාර ළමා අධ්‍යාපනය කෙරෙහි උචිත වන ආකාරයෙන් ප්‍රතිව්‍යුහගත කිරීමේදී ඒ ඒ වයස් මට්ටම්වලට උචිත පරිදි අවශ්‍ය ක්‍රියාකාරකම් සංවිධානගත කළ යුතු වේ. මෙහිදී වයස් කාණ්ඩ වර්ගීකරණය සැළකිල්ලෙන් කළ යුතු කාර්යයකි. පොදුවේ මුල් ළමාවිය, මධ්‍යම ළමාවිය සහ නවයොවුන් විය වශයෙන් ළමාවිය බෙදා දැක්වුව ද ඊට වඩා සූක්ෂම ඛණ්ඩනය කිරීමක් තුළින් ළමයින් අධ්‍යාපනික වැඩසටහන් කෙරෙහි ආකර්ෂණය කර ගැනීමට හැකි බව කෞතුකාගාර සම්බන්ධ ජාත්‍යන්තර උදාහරණ මගින් දැක්විය හැකි වේ. ලන්ඩනයේ ස්වභාවික විද්‍යා කෞතුකාගාරයේ නිල වෙබ් අඩවියේ වයස් කාණ්ඩ වර්ගීකරණය මෙහිදී උදාහරණයක් ලෙස සඳහන් කළ හැකි වේ. එනම්,

- පදනම් අදියර (වයස අවුරුදු 5ට නොවැඩි)
- පළමු අදියර (වයස අවුරුදු 5 - 7)
- දෙවන අදියර (වයස අවුරුදු 7 - 11)
- තෙවන අදියර (වයස අවුරුදු 11 - 14)
- සිවුවන අදියර (වයස අවුරුදු 14 - 16)
- වයස අවුරුදු 16න් පසු අදියර (වයස අවුරුදු 16 - 18)

වයස පිළිබඳ සිදු කරනු ලබන වර්ගීකරණයන්ගෙන් පසු අවධානය යොමු කළ යුතු වැදගත් කරුණක් වන්නේ කෞතුකාගාරය තුළ නිර්මාණය කිරීමට සුදුසු අධ්‍යාපනික ආකෘතිය පිළිබඳ තීරණය කිරීමයි. එක් ආකෘතියක් හෝ ආකෘති කිහිපයක් ළමා අධ්‍යාපනය සඳහා කෞතුකාගාර තුළ භාවිත කිරීමේ හැකියාව පවතී. ඒ අනුව ජාත්‍යන්තරය හා සසඳමින් ශ්‍රී ලංකාවේ කෞතුකාගාර තුළ ක්‍රියාත්මක කළ හැකි අධ්‍යාපනික ආකෘති කිහිපයක් පහත පරිදි වේ.

- ➢ කෞතුකාගාරය තුළ භෞතික සැකැස්ම
  - යම්කිසි ආඛ්‍යානයක් නිරූපණය කළ හැකි වන පරිදි ඵලදායී ලෙස කෞතුක භාණ්ඩ තෝරාගෙන ප්‍රදර්ශනය සැලසුම් කිරීම.
  - කෞතුක භාණ්ඩ ලේබල් සහ මැදිරි ආශ්‍රිත විස්තර පුවරු වලින් ඔබ්බට ගොස් නව ක්‍රමවේද ඔස්සේ (Gallery Cards වැනි) විස්තෘත දැනුමක් කෞතුකාගාර තුළ සම්පාදනය කිරීම.
  - ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණය භාවිතය (Audio Guide, Museum App, Digital Database, 3D සහ VR තාක්ෂණය).
  - අනුකරණය මගින් අධ්‍යාපනය ලබා දීම (චිත්‍ර සහ මූර්තිවල හස්ත, පාද හා අභින අනුකරණය, ආයුධ සහ මෙවලම් භාවිතය අනුකරණය, වාදන හා ගායනා අනුකරණය, සාම්ප්‍රදායික ශිල්ප ක්‍රම අනුකරණය).
  - ළමා ප්‍රජාවට ආකර්ෂණීය වන පරිදි සහ ඔවුන්ට පහසුවෙන් නිරීක්ෂණය කළ හැකි වන පරිදි කෞතුකාගාරය සැලසුම් කිරීම (කෞතුකාගාරය තුළ භාවිත කර ඇති වර්ණ, හැඩතල, ආලෝකකරණය වැනි අංශ).
  - ප්‍රායෝගික ක්‍රියාකාරකම් සංවිධානය කිරීම (Hands on experiences)- ශිලා මෙවලම් නිෂ්පාදනය, මැටි භාණ්ඩ සැකසීම.
  - විශේෂ අවශ්‍යතා සහිත දරුවන් වෙනුවෙන් වැඩසටහන් සහ ක්‍රියාකාරකම් සංවිධානය කිරීම (Learn by touching, Learn by touching, Braille, මැදිරි නැරඹීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම).
  - විවිධ වැඩසටහන් සංවිධානය කිරීම (විශේෂ දින මූලික කරගත් වැඩසටහන්, සංස්කෘතික වැඩසටහන්, දේශන, වැඩමුළු, රාත්‍රී කාලයේදී කෞතුකාගාරය නැරඹීම).
- ➢ කෞතුකාගාරය තුළ මාර්ගගත (Online) සැකැස්ම
  - පූර්ව ප්‍රචාරක වැඩසටහන් (Museum Trailers)
  - මාර්ගගත ප්‍රදර්ශන (Online Exhibitions)
  - මාර්ගගත කෞතුකාගාර භාණ්ඩ එකතුන් (Online Collections)
  - Virtual Tours
  - මාර්ගගත තරග පැවැත්වීම (ප්‍රෙහේලිකා, ඡායාරූප, චිත්‍ර, කෙටි වාර්තාමය වැඩසටහන්)
  - වාර්තාමය වැඩසටහන් සහ කතාන්දර වැඩසටහන්
  - සිතියම් සහ මාර්ගෝපදේශන පත්‍රිකා
  - මාර්ගගත පාඩම් (Online lessons)
  - කෞතුකාගාරය නැරඹීමට පෙර සහ පසු සිදුකළ හැකි ක්‍රියාකාරකම්

## 4. සමාලෝචනය

දැනුම ප්‍රවර්ධනය සහ මානව ජීවිතය පෝෂණය කිරීම සඳහා කෞතුකාගාර සතු ඉතා වැදගත් සම්පත් භාවිත කිරීමට සෑම කෞතුකාගාරයක් ම කැපවී සිටින බව ඉහත සමස්ත ප්‍රකාශනය ඔස්සේ ම අවධාරණය වී තිබේ. එසේම කෞතුකාගාර හරහා අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමට සෑම කෞතුකාගාරයකම කෞතුකාගාර භාරකරුවන්, කාර්යය මණ්ඩලය, සහ ස්වේච්ඡා කාර්යය මණ්ඩලය එක්ව කටයුතු කළ යුතු බව ද ඉහත දක්වා තිබේ. ඒ අනුව සනාථවන මූලික කරුණක් වන්නේ කෞතුකාගාර කෞතුක භාණ්ඩ ප්‍රදර්ශනයට සහ ආරක්ෂාවට නිර්මාණය කරගත් ආයතනික ව්‍යුහයක් පමණක් නොව විවිධ ස්වරූපයෙන් අධ්‍යාපනය ලබා දීම පිණිස නිර්මාණය වූවක් ද බවයි. අධ්‍යාපනය ලබා දීම යනුවෙන් නිශ්චිත පිරිසකට පමණක් (ළමයින්ට, පාසල් සිසුන්ට, විශ්වවිද්‍යාල සිසුන්ට සහ වැඩිහිටියන්ට ආදී වශයෙන්) කෞතුගාරවලින් අධ්‍යාපනය ලබාදීම වැනි අර්ථයක් නොකිය වේ. නමුත් මෙම අධ්‍යයනය ඔස්සේ මූලික අවධානයක් යොමු වී තිබෙන්නේ වයස අවුරුදු 18 දක්වා කාල පරාසයට අයත් ළමයින් වෙනුවෙන් ලබාදෙන අධ්‍යාපනය පිළිබඳවයි.

ඉහත සාකච්ඡාවේදී දක්වා තිබෙන ජාත්‍යන්තර කෞතුකාගාරවල ළමා අධ්‍යාපනය ම අරමුණු කරගත් වැඩසටහන් පිළිබඳ අවධානය යොමු කිරීමේදී පැහැදිලි වන්නේ ඔවුන් ඒ සඳහා සාම්ප්‍රදායිකව භාවිත වූ ක්‍රමවේද මෙන් ම නව තාක්ෂණික භාවිතයන් ද සංකලනය


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. +94 25 2266618

කරගනිමින් ක්‍රියාකාරකම් සැළසුම් කර ඇති බවයි. නමුත් ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීමේදී පැහැදිලි කර තිබෙනන්නේ අප තවමත් කෞතුකාගාර සහ ළමා අධ්‍යාපනය පමණක් නොව කෞතුකාගාර සහ අධ්‍යාපනය කෙරෙහි ද අවශ්‍ය තරම් අවධානයක් යොමු කර නැති බවයි. කෞතුකාගාර මගින් නිර්මාණය කරන අධ්‍යාපනය හුදෙක් විභාග කේන්ද්‍රීය අධ්‍යාපනය ක්‍රමයක් වැනි එකක් නොවේ. කෞතුකාගාර ඔස්සේ මූලිකවම තමන්ගේ උරුමය යොදාගනිමින් ලබාගනු ලබන පරිචයන් ආශ්‍රයෙන් පොදුවේ පුද්ගලයා, සමාජය, රට සහ සමස්ත ලෝකයට ම ඵලදායී දෑ ලබාගත හැකි බව ඉහත සාකච්ඡාවෙන් අවධාරණය කර ඇත.

ඉහත සමස්ත පැහැදිලි කිරීම් ඔස්සේ න්‍යායාත්මක වශයෙන් කොතුකාගාර සහ අධ්‍යාපනය පිළිබඳ ගොඩනැගූ දැනුම ජාත්‍යන්තර කෞතුකාගාර විසින් ළමා අධ්‍යාපනය පිණිස ගෙන ඇති පියවර සම්බන්ධ අත්දැකීම් සමග විග්‍රහ කරගනිමින් ශ්‍රී ලංකාවේ කෞතුකාගාර ක්‍රියාවලිය තුළ ළමා අධ්‍යාපනය සඳහා සුදුසු ආකෘති නිර්මාණය කරගැනීමට අවශ්‍ය යෝජනා ඉදිරිපත් කර තිබේ. නමුත් එම යෝජනා ක්‍රියාවට නැංවීමට නම් කෞතුකාගාර පද්ධතිය ප්‍රතිව්‍යුහගත කිරීම අත්‍යවශ්‍ය තත්ත්වයකි. එලෙස කෞතුකාගාර ළමා අධ්‍යාපනය වෙනුවෙන් ප්‍රතිව්‍යුහගත කරන්නේ නම් වර්ථමාන සහ අනාගත ශ්‍රී ලංකාවේ ආර්ථිකමය සහ සමාජීමය ක්ෂේත්‍ර රැසක ප්‍රගමනයට එය සාධනීය ආකාරයෙන් දායක කරගැනීමේ හැකියාව තිබේ.

## ආශ්‍රිත ග්‍රන්ථ හා ලිපි


ද සිල්වා, පී. එච්. ඩී. එච්. 1996, ***කෞතුකාගාර විද්‍යා මූලධර්ම***, කතෘ ප්‍රකාශන.

දිසානායක, ජී. ආර්. 1999, ***ශ්‍රී ලංකාවේ කෞතුකාගාර සහ සන්නිවේදනය***, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

Ambrose, T. & Paine, C. 2006, ***Museum Basics***, Routledge.

Dean, D. 1994, *Museum Exhibition Theory and Practice*, Routledge.

Hein, G. 1998, ***Learning in the Museum***. Routledge.

***Excellence in Practice***: *Museum Education Principles and Standards*, 2005, Ed. Fortescue, A. and et al. American Association of Museum.

***Key Concepts of Museology***, 2010, Ed. André Desvallées and François Mairesse Armand Colin.

Moore, K. 1994, ***Museum Management***. Routledge, New York.

**American Association of Museums** [https://www.aam-us.org/programs/ethics-standards-and-professional-practices/code-of-ethics-for-museums/]


I**COM Statutes adopted by the 22nd General Assembly Vienna**, Austria, 24 August 2007 (http://icom.museum/the-vision/museum-definition/)London Natural History Museum official webpage [http://www.nhm.ac.uk/]

**Louvre Museum official webpage** [http://www.louvre.fr/en]

**Metropolitan Museum official webpage** [http://www.metmuseum.org/]

**Newdelhi National Museum official webpage** [http://www.nationalmuseumindia.gov.in/]

**UNICEF official webpage** [https://www.unicef.org/child-rights-convention/convention-text]

රූපය 01
සංකල්ප රාමුව (කතුවරුන් විසින් සකසන ලද්දකි)



ඡායාරූපය 01
නවදිල්ලි ජාතික කෞතුකාගාරය ආශ්‍රිත ළමා අධ්‍යාපනික වැඩසටහන්
(http://www.nationalmuseumindia.gov.in/en)




ඡායාරූපය 02
#MetKids වැඩසටහන
(https://www.metmuseum.org/)



*JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. +94 25 2266618*



ඡායාරූපය 03
#MetKids වැඩසටහන (https://www.metmuseum.org/)




ඡායාරූපය 04
ලන්ඩනයේ ස්වභාවිකවිද්‍යා කෞතුකාගාරය ආශ්‍රිත ළමා අධ්‍යාපනික වැඩසටහන් (https://www.nhm.ac.uk/)




ඡායාරූපය 05
A closer look at the Seated Scribe වැඩසටහන
(http://www.louvre.fr/en)


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. +94 25 2266618